සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2017

## 10 - ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - I

නම/විභාග අංකය :- .................................................. කාලය: පැය 01 යි.

පැලකිය යුතුයි:
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

(01) සිදුහත් බෝසත් උපත ලොව සිදුවූ අසිරිමත් සිදුවීමකි. ඒ සඳහා දේව ආරාධනාව කළ පසු බෝසත්වරයෙකු විසින් පූර්ව අධ්‍යයනයක් කරනු ලැබේ. මෙම අධ්‍යයනය
(1) පංච අභිඥා නම් වේ.
(2) පංච බලි නම් වේ.
(3) පංචෝපාදානස්කන්ධ නම් වේ.
(4) පංච මහා විලෝකන නම් වේ.

(02) ධන බලය, රජ බලය, ආදී සියලු සැප සම්පත්තින් නොඅඩුව ලැබුණු සිදුහත් කුමරාට එපද කළ නොහැක්කක් නොවී ය. එබැවින් සිදුහත් කුමරු
(1) පිරිවෙතුගේ උපදෙස් අනුගමනය නොකළේ ය.
(2) තම හැකියාවන් අන් අය අභියෝගයට ලක්වන ලෙස ප්‍රදර්ශනය කළේ ය.
(3) කිසිවකින් උදම් නොවී සියල්ල වටහා නුවණින් යුතුව සිදු කළේ ය.
(4) මිල මුදල් වියදම් කරමින් කාමභෝගී ජීවිතයක් ගත කළේ ය.

(03) සුද්ධෝදන රජතුමාගේ එකම අභිලාෂය සිදුහත් කුමරු සක්විති රජකෙනෙකු කිරීම ය. එහෙත් කුමරුගේ අභිලාෂය වූයේ සියල්ල හැර දමා ගොස් පැවිදි වීම ය. මෙසේ පැවිදි වීමට සිදුහත් බෝසතුන් විශේෂ කැමැත්තක් දැක්වූයේ,
(1) සක්විති රජ කෙනෙක් වීම ඉතා දුෂ්කර කරුණක් සේ පෙනීගිය නිසා ය.
(2) සක්විති රජ කෙනෙක් වීමේ දී අනෙක් බොහෝ රජවරු සමඟ ගැටුම් ඇති කරගැනීමට සිදුවන බැවිනි.
(3) සක්විති රජෙකු වුව ද සසරෙහි ඉපිද ජාති, ජරා, මරණ ආදී දුක්වලට මුහුණ දීමට සිදු වන නිසා ය.
(4) නිවන් මග සොයාගෙන තමාද, පිය රජතුමා, සුළු මව, යසෝදරාව හා පුත් කුමරු ඇතුළු සියලු ලෝ සතුන් සසර දුකින් මුදවා ගැනීමට ය.

(04) බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය ලොව පහළ වූ පෝදින දෙක පිළිවෙළින්,
(1) ඇසළ පෝ දින හා වෙසක් පෝ දින ය.
(2) වෙසක් පෝ දින හා ඇසළ පෝ දින ය.
(3) වෙසක් පෝ දින හා පොසොන් පෝ දින ය.
(4) වෙසක් පෝදින, දුරුතු පෝ දින ය.

(05) බුදුරජාණන් වහන්සේ යමක් මනසෙහි රඳවා ගැනීමටත් නැවත සිහියට ගෙන ගැනීමටත් අපහසු වන අවස්ථා කිහිපයක් ඇති බව උපමා මගින් එක්තරා බ්‍රාහ්මණයෙකුට පැහැදිලි කළ සේක. ඒ අනුව පාසි සහිත ජලයට උපමා කළ නීවරණය වන්නේ,
(1) කාමච්ඡන්දය (2) ව්‍යාපාදය (3) ථීනමිද්ධ (4) උද්ධච්ච කුක්කුච්ච

(06) ඛුද්දක නිකායට අයත් බෞද්ධයාගේ අත්පොත ලෙස හඳුන්වන ධම්මපදයේ ඇති වග්ග (පෙළ) ගණන හා ගාථා ගණන පිළිවෙළින්,
(1) 26 හා 423කි. (2) 62 හා 234කි. (3) 24 හා 423කි. (4) 29 හා 343කි.

(07) අසාර බව, අනාත්මීය බව, තුච්ඡ බව, අර්ථ ශූන්‍ය බව යන අදහස හා ගැළපෙන වචනය වන්නේ,
(1) දුක්ඛ (2) සුඛ (3) සංඛාර (4) අනිත්‍ය

(08) A - මුනිගුණාලංකාරය　　B - බුදුගුණ අලංකාරය　　C - පාරමිතා ප්‍රකරණය
D - සාරාර්ථ සංග්‍රහය　　E - සතර බණවර සන්නය
යන ග්‍රන්ථ අතුරින් වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමියන් රචනා කරන ලද ග්‍රන්ථ වන්නේ,
(1) A, B, C ය.　　(2) B, C, D ය.　　(3) C, D, E ය.　　(4) A, D, E ය.

(09) බුදුරජාණන් වහන්සේ ලෝකයේ මෙතෙක් පහළ වූ ශ්‍රේෂ්ඨතම සලප වෛද්‍යවරයා ය. මනෝ වෛද්‍යවරයා ය. ලෝවැඩ සඟරාව අනුව උන්වහන්සේ හඳුන්වා ඇත්තේ "සත්හට වන බව දුකට වෙදාණන්" යනුවෙනි. මේ අනුව බුදුරජාණන් වහන්සේ ප්‍රතිකාර කරන්නේ,
(1) වා, පිත්, සෙම් යන තුන්දොස් කිපීමෙන් හටගන්නා රෝග වලට ය.
(2) පාචනය, ඩෙංගු, මැලේරියා, බරවා යනාදී රෝග වලට ය.
(3) රාග, ද්වේෂ, මෝහ ආදියෙන් හටගන්නා රෝග වලට ය.
(4) කුෂ්ඨ රෝග, පිළිකා, පීනස, ගතිය වැනි රෝග වලට ය.

(10) බුදු දහම් අනුව ප්‍රඥාව යනු,
(1) පොතපතින් හා ගුරුවරුන්ගෙන් ලබා ගන්නා දැනුම ය.
(2) හේතු සාධක සහිතව කරුණු ඉදිරිපත් කරමින් තර්ක කොට එළඹෙන නිගමන ය.
(3) කුසල සිත හා එක්වූ විදර්ශනා ඥානය ය.
(4) නවීන සන්නිවේදන මාධ්‍යයන් මගින් ලබා ගන්නා දැනුම ය.

(11) උත්සාහය පෙරටු කොටගෙන ගුණ නුවණින් ක්‍රියාකොට ජීවිතය ජයගත් සමකාලීන තරුණයෙකුට බුදුරජාණන් වහන්සේ "උට්ඨානවතෝ සතිමතෝ සුචිකම්මස්ස නිසම්මකාරිනෝ..." යන ධම්මපද ගාථාව දේශනා කළ සේක. මෙම ගාථාවේ සඳහන් නිසම්ම කාරිනෝ යන්නෙන් අදහස වන්නේ,
(1) උත්සාහයෙන් හා නොපසුබසිනා වීර්යයෙන් වැඩ කළ යුතු බව ය.
(2) එළඹ සිටි සිහියෙන් හා යහපත් කල්පනාවෙන් ක්‍රියා කළ යුතු බව ය.
(3) කයින් වචනයෙන් හා සිතින් නිදොස් දේ කළ යුතු බව ය.
(4) නුවණින් පිරික්සා සිතා විමසා දොස් නිදොස් බලා නිදොස් දේ කිරීම ය.

(12) දුශ්ශීලව නොසන්සුන් සිත් ඇතිව අවුරුදු සියක් ජීවත්වීමට වඩා සිල්වත්ව සන්සුන් සිත් ඇතිව දවසක් ජීවත්වීම ශ්‍රේෂ්ඨ ය. මෙම අදහස ඇති ධම්මපද ගාථා පාඨයේ ආරම්භක පෙළ වන්නේ,
(1) යථාපි මූලේ අනුපද්දවේ දළ්හේ.... යන්න යි.　　(2) ආරෝග්‍යා පරමා ලාභා.... යන්නයි.
(3) සුභානු පස්සිං විහරන්තං.... යන්නයි.　　(4) යෝ ච වස්සසතං ජීවේ යන්න යි.

(13) බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය ආදර්ශයට ගැනීමට සුදුසු කරන බෞද්ධ දරුවන් කළ යුත්තේ,
(1) වැරදි බහුල සමාජයේ අනුශෝතගාමීව කටයුතු කිරීම ය.
(2) සුසිරිත් පිටුදැක දුසිරිත් අනුව අවම පෞරුෂයක් ඇතිව සිටීම ය.
(3) සමාජ විරෝධී, නීති විරෝධී ක්‍රියා අප වටා සිදුවෙද්දීත් ඒ කිසිවක නොහැරී නොඇලී පිරිසිදුව කටයුතු කිරීම ය.
(4) කෙලෙස් සහිත පුහුදුන් මිනිස් සමාජයේ එහිම ඇලී ගැලී සිටීම ය.

(14) කීර්තිය හා අපකීර්තිය අටලෝ දහමට අයත් කරුණු දෙකකි. කිසියම් පුද්ගලයෙකුට ඉහත කරුණු දෙකට බලපාන මූලිකම සාධකය වන්නේ පුද්ගලයාගේ,
(1) උපත්තම ය.　　(2) හොඳ හෝ නරක ක්‍රියාකාරකම් ය.
(3) උපත ලබා ඇති කුල ගෝත්‍රය ය.　　(4) ජීවත්වන ප්‍රදේශය ය.

(15) දුටුගැමුණු රජතුමා කළ ලෝවාමහා ප්‍රාසාදය හේ අපිරමත් බෞද්ධ ගොඩනැගිල්ල දෙවැනි වන්නේ,
(1) ථූපාරාමයට ය.　　(2) මහාසෑයට ය.　　(3) ජේතවනයට ය.　　(4) මිරිසවැටියට ය.

(16) සීලයෙන් යුතුව සමාධි භාවනාව සඳහා යොමුවීමේ දී පුද්ගලයා තුළ තිබිය යුතු ගුණාංග තුනක් දහමෙහි සඳහන් වේ. සන්තුට්ඨිතා යනුවෙන් අදහස් වන්නේ,
(1) ලද දෙයින් සතුටුවීම ය.　　(2) ඉන්ද්‍රිය සංවර කර ගැනීම ය.
(3) සතර ඉරියව් නිවැරදිව පවත්වා ගැනීම ය.　　(4) අනභිමානී ගුණය ප්‍රගුණ කිරීම ය.

(17) සිඟාල නම් තරුණයාට බුදුන් වහන්සේ දේශනා කළ සිඟාලෝවාද සූත්‍රයේ දිසාවන්ට අයත් සමාජ කොටස් ද දක්වා ඇත. ඒ අනුව පහත සඳහන් සමාජ කණ්ඩායම් හා ගැළපෙන දිශාවන් පිළිවෙළින්

A - මවුපියන් B - පුත්‍රදාරාවන් C - හිතමිතුරන් D - සේවක සේවිකාවන්

(1) දකුණ, උඩ, යට, බටහිර (2) නැගෙනහිර, බටහිර, උතුර, යට
(3) දකුණ, නැගෙනහිර, උඩ, යට (4) උඩ, යට, බටහිර, නැගෙනහිර

(18) පඨවි, ආපෝ, තේජෝ, වායෝ යනු.
(1) සතර අගති (2) සතර කර්ම ක්ලේශ
(3) සතර ඍද්ධි පාද (4) සතර මහා භූත රූප

(19) "කිසිවෙක් මා සොරුවෙන් රවටනවාට මා අකැමැති බැවින් මම ද කිසිදාක කිසිවකු සොරුවෙන් නොරවටමියි." යනුවෙන් සිතේ ය. ඔහු අනුගමනය කරන්නේ.
(1) අත්තූපනායික ධර්ම පර්යාය (2) ත්‍රිකෝටි පරිශුද්ධි ශීලය
(3) අධිපති ධර්ම (4) ඉන්ද්‍රිය සංවර ශීලය

(20) පසුගිය කාලයේ ගංවතුර ඇතිවූ අවස්ථාවේ ලාංකික සියලු දෙනා ම එක්ව විපතට පත්වූවන්ට විවිධාකාරයෙන් පිහිටවූහ. මෙහි දී ජාති, ආගම්, උස් පහත්කම් ආදී භේද නොසැලකූහ. මින් ප්‍රකට වන්නේ ලාංකික ජනතාව තුළ ඇති
(1) සාමකාමීබවයි. (2) උපාය කුසලතාවයි.
(3) සහජීවනයයි. (4) අවේගශීලීබවයි.

(21) දස අකුසල් අතර සිතින් සිදු කරන අකුසල් වලට අයත්වන්නේ.
(1) ප්‍රාණඝාතය, ව්‍යාපාදය, අදත්තාදානය
(2) අභිධ්‍යාව, මිථ්‍යාදෘෂ්ටිය, ව්‍යාපාදය
(3) ප්‍රාණඝාතය, මුසාවාදය, කාමයේ වරදවා හැසිරීම
(4) මුසාවාදය, පිසුනාවාචා, පරුෂාවාචා

(22) සුමේධා දුගී පවුලක උපත ලැබුව ද උසස් රූප සෝභාවකින් යුක්ත වූ නිසා ඇයගේ ජීවිතය වාසනාවන්ත කර ගැනීමට ඇයට හැකි විය. මෙයට හේතු වූයේ,
(1) ගති සම්පත්තියයි. (2) උපධි සම්පත්තියයි. (3) කාල සම්පත්තියයි (4) උපධි විපත්තියයි

(23) දෙවන ආත්මභාවයෙන් පසුව කවර හෝ ආත්ම භාවයක දී විපාක දෙන කර්මය වන්නේ.
(1) අපරාපරියවේදනීය කර්ම (2) උපපජ්ජ වේදනීය කර්ම
(3) ජනක කර්ම (4) ආසන්න කර්ම

(24) බුදු දහමේ ප්‍රධානතම ඉගැන්වීම පටිච්ච සමුප්පාදයයි. එහි "පටිච්ච සමුප්පාද" යන යෙදුම හා නොගැළපෙන්නේ.
(1) සහේතුක බව (2) අහේතුක බව (3) හේතු සහිත බව (4) අහේතුක නොවන බව

(25) අකුසලය ද අකුසල මූලය ද, කුසලය ද කුසල මූලය ද, අකුසලය ද අකුසල විපාකය ද.... යනාදී වශයෙන් දැන දැක ගන්නා ඥානය,
(1) සම්මා දිට්ඨියයි. (2) සම්මා සංකප්පයයි. (3) සම්මා කම්මන්තයයි. (4) සම්මා සතියයි.

(26) භික්ෂූන් පිරිසක් මහ ශබ්ද නගමින් උස් හඬින් කතා කරන විට ඔවුන් පේ ශෝභා නොකොට ආරාමයෙන් පිටව යන ලෙස අවවාද කළේ.
(1) සෝණ දණ්ඩ බ්‍රාහ්මණයා ය. (2) බුදුරජාණන් වහන්සේ ය.
(3) ආනන්ද හාමුදුරුවෝ ය. (4) මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ය.

(27) එංගලන්තයේ පාලි ග්‍රන්ථ සමාගම ("PALI TEXT SOCIETY") නම් සමාගම පිහිටුවා ගනු ලැබුවේ,
(1) කර්නල් හෙන්රි ඕල්කට්තුමා ය. (2) අනගාරික ධර්මපාලතුමා ය.
(3) රිස් ඩේවිඩ්ස් පඬිතුමා ය. (4) ශ්‍රීමත් එඩ්වින් ආර්නෝල්ඩ් තුමා ය.

(28) අටුවා ග්‍රන්ථ තඹපත් ඉරුවල ලියවා ගෙල්මුවා මංජුසාවල බහා ස්තූපයක තැන්පත් කරමින් ඒවායේ සුරක්ෂිතතාව තහවුරු කළේ.
(1) අලුවිහාර සංගායනාවේ දී ය. (2) කනිෂ්ක ධර්ම සංගායනාවේ දී ය.
(3) තෙවන ධර්ම සංගායනාවේ දී ය. (4) දෙවන ධර්ම සංගායනාවේ දී ය.

(29) දැනට විද්වතුන්ගේ සම්භාවනාවට ලක්වූ කලාත්මක මුරගල හමුවන්නේ,
(1) අනුරාධපුර බිසෝ මාලිගය අසලිනි.
(2) පොළොන්නරුව ගල්විහාරය අසලිනි.
(3) අභයගිරියට අයත් රත්නප්‍රාසාදය නමැති ගොඩනැගිල්ල සමීපයෙනි.
(4) මිරිසවැටි චෛත්‍යය අසලිනි.

(30) බුදුරජාණන් වහන්සේ වේදනා පරිග්ගහ සූත්‍රය හා මහාසීහනාද සූත්‍රය දේශනා කළ ස්ථාන දෙක පිළිවෙළින්,
(1) ඉසිපතනයේ මිගදාය හා සූකරඛත ලෙණ ය.
(2) විශාලා මහනුවර වන පියස හා සාලන්දක නිවාප නම් ස්ථානයේ
(3) සූකරඛත ලෙණ හා විශාලා මහනුවර වන පියස
(4) ඇවිරෝරිය වනය හා ජීවක අඹ වනය

(31) අවධිමත් ලෙස එමෙන් ම ගිජු ලෙස ආහාර අනුභව කරන්නන් පස්දෙනෙක් ගැන බෞද්ධ පාලිගතයේ සඳහන් වේ. ඉන් ආහාර ගත් පසු ඇඳුම් ඇඳ ගැනීමටවත් බැරි තරමට ඇඳුම් ගැනවත් නොසලකා ආහාර ගන්නා තැනැත්තා,
(1) ආහාර හත්ථක නම් වේ.
(2) අලංසාටක නම් වේ.
(3) තත්ථවට්ටික නම් වේ.
(4) කාකමාසක නම් වේ.

(32) කුපික්කල තිස්ස හිමියන්ට අභයගිරිය කරවා පූජා කරන ලද්දේ,
(1) දුටුගැමුණු රජතුමා
(2) වලගම්බා රජතුමා
(3) ප්‍රාදේශීය නායකයෙක්
(4) මහසෙන් රජතුමා

(33) මෙතෙක් හමුවී ඇති කලාත්මක බවින් උසස්ම බෝධිඝරය දක්නට ලැබෙන ස්ථානය වන්නේ,
(1) අනුරාධපුර බිසෝ මාලිගය අසල
(2) මිහින්තලේ කණ්ඨක චෛත්‍යය අසල
(3) අභයගිරියට අයත් රත්නප්‍රාසාදය නැමති ගොඩනැගිල්ල අසල
(4) කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්ගම

(34) මයුරපාද පිරිවෙන්පති බුද්ධ පුත්‍ර හිමියන් විසින් නව අරහාදි බුදුගුණ අතර "අරහං" බුදු ගුණය තේමා කරගනිමින් රචනා කර ඇති කෘතිය වන්නේ,
(1) ලෝවැඩ සඟරාව
(2) සද්ධර්ම රත්නාවලිය
(3) පූජාවලිය
(4) අමාවතුර

(35) යම් රාජ්‍යයක යහපාලනයක් පවත්වාගෙන යාමට උපකාර වන රාජ්‍ය පාලන ප්‍රතිපත්ති අතර දස සක්විති වත් වැදගත් තැනක් ගනී. එම පිළිවෙත් දහය පිළිබඳව දැක්වෙන්නේ,
(1) චක්කවත්ති සීහනාද සූත්‍රයේ
(2) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ය.
(3) සිගාලෝවාද සූත්‍රයේ ය.
(4) පත්තකම්ම සූත්‍රයේ ය.

(36) මාස ගණනක් බුදුරජාණන් වහන්සේ සමග පිරිමින් උන්වහන්සේගේ දැවැත්ම පරීක්ෂා කළේ,
(1) බ්‍රහ්මායු නම් බමුණෙක්
(2) වක්කලි තෙරුන්වෝ
(3) දුක්කුතාති නම් තැනැත්තා
(4) ද්‍රෝණ බමුණා

(37) වර්තා, ත්‍රිවිධ රත්නය කෙරෙහි පැහැදීමකින් සිටින තැනැත්තියකි. ඇය තුළ ඇත්තේ,
(1) චිත්තබවයි.
(2) සිල්වත්බවයි.
(3) සමජීවිකතාවයි.
(4) අවෙච්චප්පසාදයයි.

(38) රටවැසියන්ගේ යහපත හා දියුණුව වෙනුවෙන් කටයුතු කිරීම රාජ්‍ය පාලකයාගේ යුතුකමයි. එය දසරාජ ධර්මවල හඳුන්වන්නේ,
(1) දානය නමිනි
(2) අර්ථ චර්යාව නමිනි.
(3) සමානාත්මතාවය නමිනි.
(4) අවිහිංසාව නමිනි.

(39) සතර සංග්‍රහ වස්තුවට අයත්වන්නේ,
(1) දානය, සීලය, භාවනා, පත්තිදාන
(2) මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා
(3) ඡන්ද, චිත්ත, විරිය, විමංසා
(4) දානය, ප්‍රියවචන, අර්ථචර්යාව, සමානාත්මතාව

(40) සීමාව, ප්‍රමාණය දැන ආහාර වැළඳූ විට ආහාර සෙමෙන් දිරයි. ඔවුන්ගේ ආයුෂ වැඩෙන්නේ ය. යනුවෙන් සඳහන් වන්නේ,
(1) ද්‍රෝණපාක සූත්‍රයේ
(2) ධම්මපදයේ
(3) මහා නිදාන සූත්‍රයේ
(4) භද්දාලි සූත්‍රයේ

(ලකුණු 40)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2017

## 10 - ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - II

නම/විභාග අංකය :- ............................................................. කාලය: පැය 02 යි.

පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) (i) ලෝකය හා ජීවිතය පිළිබඳ අපට ඇති කරගත හැකි අවබෝධය දෙයාකාර ය. ඒවා නම් කරන්න.

(ii) භෝග විනාශයට හේතුවන කරුණු දෙකක් ලියන්න.

(iii) බුදුදහමේ ගිහි පක්ෂය කොටස් දෙකකින් යුක්ත ය. එම කොටස් දෙක නම් කරන්න.

(iv) භාරතීය සමාජයෙහි ප්‍රධාන වශයෙන් පිළිගත් විමුක්තිකාමී පටිපදා දෙක කුමක් ද?

(v) ථේරවාදී බෞද්ධ ධර්ම සංගායනා අතර හතරවන හා පස්වන ධර්ම සංගායනා දෙක පැවැත්වූ රටවල් පිළිවෙළින් ලියන්න.

(vi) වාහල්කඩ යන්න හඳුන්වන්න.

(vii) අනුරාධපුර යුගයට අයත් සිතුවම් හමුවන්නේ ස්ථාන කිහිපයක පමණි. ඒ අතර එම යුගයට අයත්වන විශේෂ තැනක් ගන්නා සිතුවම් ඇති ස්ථාන දෙකක් ලියන්න.

(viii) "බුදුගුණ අනන්ත වන බැවින් නව ගුණ හැම කියත් නොපිළිවනින් එහි පූර්වපදම්ම කාරී යන පදය ගෙණ ද... යනුවෙන් ග්‍රන්ථය ආරම්භයේ දී දක්වා ඇත්තේ කිනම් ග්‍රන්ථයක් ද? එහි කතුවරයා කවරෙක් ද?

(ix) සියලු කෙලෙස් නැති කළ පසු ලැබෙන ලෝකෝත්තර ඥානය කුමක් ද?

(x) ත්‍රිලක්ෂණ නම් කරන්න. (ලකුණු 02 x 10 = 20)

(02) (i) සිදුහත් කුමරු ශිල්ප ශාස්ත්‍ර උගත් බමුණු පඬිවරයා නම් කරන්න. (ලකුණු 02)

(ii) සිදුහත් කුමරුගේ ළමා කාලයේ වූ විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ගිහි ජීවිතයේ අභියෝග ජයගැනීමට බෝසත් චරිතය තුළින් ගතහැකි ආදර්ශ විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) පෙරුවත් නම් කරන්න. (ලකුණු 02)

(ii) මහා සංඝරත්නය සුපටිපන්න නම් වන්නේ කුමන හේතු නිසා ද? (ලකුණු 03)

(iii) පාසල් සිසුන් වන ඔබට රැකිය හැකි ප්‍රතිපත්ති විස්තර කරන්න. (ලකුණු 05)

(04) (i) විතලය මහ වනයෙහි ඇද වැටුණු තැනම දිරාපත්ව යන්නාක් මෙන්..... යන අදහස දැක්වෙන ධම්මපද ගාථාව ලියන්න. (ලකුණු 02)

(ii) එම ගාථාවේ තේරුම ලියන්න. (ලකුණු 03)

(iii) වැඩිහිටි වයසට පත්වූ පසු පසුතැවින් සොම්නසින් සිටීම සඳහා බාල තරුණ කාලවල දී කටයුතු කළ යුතු ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

(05) බුදුදහමේ චිර පැවැත්ම සඳහා සිදු කෙරුණු ක්‍රියාකාරකම් අතර ධර්ම සංගායනා ප්‍රමුඛ ස්ථානයක් ගනී. ඒ අනුව ථේරවාද ඉතිහාසයේ සිදු කළ ධර්ම සංගායනා පහක් පිළිබඳ ශාසන ඉතිහාසය සාක්ෂි දරයි.

(i) ධර්ම සංගායනාවක දී සාකච්ඡාවට ලක්වන ප්‍රධාන කරුණු දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) පළමු, දෙවන හා තෙවන සංගායනා පැවැත්වූ ස්ථාන පිළිවෙළින් ලියන්න. (ලකුණු 03)

(iii) පුස්තකාරූඪ සංගීතිය හඳුන්වා එම සංගායනාවේ ප්‍රතිඵල විස්තර කරන්න. (ලකුණු 03)

(06) විවිධ තුරුලතා මෙන් ම ගොඩනැගිලි ද පිරුණු පරිසරයක වුව ද බෞද්ධ විහාරස්ථානයක් වෙන්කොට හඳුනාගැනීමේ සලකුණ වන්නේ සුදෝ සුදුවන්ව බබළන ස්තූපයයි. එය සිංහල බෞද්ධ සංස්කෘතියේ සංකේතයයි.

(i) බුදු දහම ස්ථාපිත වීමෙන් පසු ලක්දිව ගොඩනැගුණු මුල්ම ස්තූපය කුමක් ද? (ලකුණු 02)

(ii) ගර්භයේ හැඩය අනුව ස්තූප හයාකාර වේ. ඒ අනුව පහත ස්තූප කවර හැඩයකට අයත්දැයි පිළිවෙළින් ලියන්න.

1. රුවන්වැලි මහා සෑය -
2. මහියංගන චෛත්‍යය -
3. කැලණි චෛත්‍යය - (ලකුණු 03)

(iii) අපගේ පෞරාණික උරුමයන් ආරක්ෂා කරගත යුත්තේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 06)

(07) පහත සඳහන් මාතෘකාවලින් කොටස් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

(i) සප්ත අපරිහානිය ධර්ම

(ii) ශ්‍රද්ධාව

(iii) දුටුගැමුණු රජතුමා

(iv) කවිසිළුමිණ (ලකුණු 05 x 2 = 10)